# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2103/16 - 2018 දෙසැම්බර් මස 27 වැනි බ්‍රහස්පතින්දා - 2018.12.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ යොමු අංකය:* 4/1/ඉ/අත්පත්/87/2016(DIVML/13/2018).
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය:* 4-3/ 7 /2016/එච්ඩබ්ලිව් /310.

පොදු ජන කටයුත්තක් සඳහා පහත දැක්වෙන ඉඩම් රජයට අත්කර ගෙන ඇත. ඒ අනුව ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් දන්වා සිටිමි.

*අත්කරගෙන ඇති ඉඩමේ විස්තර:*

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 713, මැහිඇල්ල ග්‍රාම නිළධාරී කොට්ඨාසයේ, මැහිඇල්ල ගමේ පිහිටි සර්වේ ජනරාල් වෙනුවෙන් කුරුණෑගල කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී විසින් පිළියෙල කරන ලද අංක 420202, කලාප අංක 07, පත්‍ර අංක 2 හා 2018.12.17 දරන කැඩැස්තර සිතියමේ කැබලි අංක 123, 124, 126, 128, 130, 132 හා 133 වූ ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.4030 ක් වූ පහත විස්තර කර ඇති ඉඩම් කැබලි හත(07).

01. කැබලි අංක 123
ඉඩමේ නම: දිප්පිටියේ වත්ත;ඉඩම් පරිහරණය: මිශ්‍ර වගාවක් සහිත වත්ත; හිමිකම් පාන්නා: රජය;මුල් හිමිකම් පාන්නා:දේවතා පේජ්ජලාගේ වත්තුවාගේ මුතුවා *හෙවත්* දේවපක්ෂ චන්ද්‍රසේන (මියගිය); ප්‍රමාණය: හෙක්. 0.1526.

02. කැබලි අංක 124
ඉඩමේ නම: දිප්පිටියේ වත්ත;ඉඩම් පරිහරණය: මිශ්‍ර වගාවක් සහිත වත්ත; හිමිකම් පාන්නා: රජය;මුල් හිමිකම් පාන්නා:දේවතා පේජ්ජලාගේ වත්තුවාගේ මුතුවා *හෙවත්* දේවපක්ෂ චන්ද්‍රසේන (මියගිය); ප්‍රමාණය: හෙක්. 0.0229.

03. කැබලි අංක 126
ඉඩමේ නම: කනුකැටියේ කුඹුර;ඉඩම් පරිහරණය: කුඹුර; හිමිකම් පාන්නා: රජය;මුල් හිමිකම් පාන්නා: දේවතා පේජ්ජලාගේ සූරියපාල සහ රාජපක්ෂගේ විමලාවතී; ප්‍රමාණය: හෙක්. 0.0413.

04. කැබලි අංක 128
ඉඩමේ නම: බෙලිකොටුව;ඉඩම් පරිහරණය: කුඹුර; හිමිකම් පාන්නා:රජය;මුල් හිමිකම් පාන්නා:දේවපක්ෂ ගාමිනි කුමාරරත්න (මියගිය); ප්‍රමාණය: හෙක්. 0.0598.



මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

05. **කැබලි අංක 130**

ඉඩමේ නම:කනුකැටියේ කුඹුර;ඉඩම් පරිහරණය: කුඹුර; හිමිකම් පාන්නා:රජය;මුල් හිමිකම් පාන්නා:රන්කොත් දුරයලාගේ සුනේත්‍රා; ප්‍රමාණය: හෙක්. 0.0868.

06. **කැබලි අංක 132**

ඉඩමේ නම:පඹුරුගස්වෙල කුඹුර;ඉඩම් පරිහරණය: කුඹුර; හිමිකම් පාන්නා:රජය;මුල් හිමිකම් පාන්නා:හවඩියා දුරයලාගේ නිමල් වීරරත්න; ප්‍රමාණය: හෙක්. 0.0288.

07. **කැබලි අංක 133**

ඉඩමේ නම:පඹුරුගස්වෙල කුඹුර;ඉඩම් පරිහරණය: කුඹුර; හිමිකම් පාන්නා:රජය;මුල් හිමිකම් පාන්නා:හවඩියා දුරයලාගේ නිමල් වීරරත්න; ප්‍රමාණය: හෙක්. 0.0108.

මෙම ඉඩම් කැබලි සඳහා අයිතිවාසිකම් කියන සියලු දෙනාම තම තමන්ගේ නම් *ගැසට් පත්‍රයේ* පළවී ඇතත්, නැතත් එම ඉඩම් සම්බන්ධයෙන් තමන්ට ඇති අයිතිවාසිකම්, එක් එක් බිම් කැබැල්ල වෙනුවෙන් වෙන වෙනම, පිටපත් දෙකකින් යුත් ලියවිල්ලකින් එම ඉඩම්වලට ඇති ස්වකීය අයිතියේ ස්වභාවය හා එම ඉඩම් කැබලිවල අයිතිය වෙනුවෙන් තමන්ට ඉදිරිපත් කළ හැකි සාක්ෂි, වන්දි මුදල හා එය ගණන් බැලූ ආකාරය පිළිබඳ විස්තරයන් 2019.01.07 දින මගේ කාර්යාලයේදී මා හමු වී ඉදිරිපත් කරන ලෙස මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඒ අනුව 2019.01.22 දින සිට මා විසින් දැනුම් දෙනු ලබන දිනකදී තමන් විසින්ම නැතහොත් ලිඛිතව බලය පවරනු නියෝජිතයකු මගින් නියමිත දින නියමිත වේලාවට, අදාළ ඔප්පු හා මා විසින් නියම කරනු ලබන අනෙකුත් ලියවිලි සමග මා විසින් නියම කරනු ලබන ස්ථානයකදී පනතේ 09 වෙනි වගන්තිය යටතේ හිමිකම් පරීක්ෂණය සඳහා ඉදිරිපත් විය යුතුය.

පරීක්ෂණය සඳහා නියෝජිතයෙකු ඉදිරිපත් කරන්නේ නම් ඉඩම් හිමිකම් කියන්නා විසින් බලය පවරන ලද ලිපියක් නොමැතිව ඔහුගේ/ඇයගේ ප්‍රකාශ හෝ සාක්ෂි සටහන් කරගනු නොලබන බව අවධාරණය කරමි.

ආර්.එම්.පී.රත්නායක,
ප්‍රාදේශීය ලේකම් හා ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි,
මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය.

2018 ක් වූ දෙසැම්බර් මස 24 වැනි දින,
මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

01 - 216

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.